මහරගම නගර සභාව - 2022

----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහරගම නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහරගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මූල්‍ය ප්‍රකාශනවලට අදාළව මා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** මූල්‍ය ප්‍රකාශන

**1.6.1** ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ත්‍රෛමාසික ස්ථාවර තැන්පත් ලෙස ආයෝජනය කර තිබූ රු.255,000,000 ක් ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවත් දිගු කාලීන ආයෝජන යටතේ දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කළ යුතු රු.51,916,753 ක් ද සවිකිරීම් යටතේ ගිණුම්ගත කළ යුතු රු.10,097,983 ක් ද පාරවල්, පාලම් හා බෝක්කු ගිණුමට හර කර තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කළ යුතු අළුත්වැඩියා වියදම් රු.4,230,450 ක් පාරවල්, පාලම් හා බෝක්කු ගිණුමට ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ජ'නල් වවුචර් අංක 45 යටතේ ඉකුත් වර්ෂයට අදාළව පාරවල්, පාලම් හා බෝක්කු ගිණුම්ගත කිරීමේදී අළුත්වැඩියා වියදම් වෙනුවෙන් දරන ලද රු.23,742,772 ක් ද පාරවල්, පාලම් හා බෝක්කු ගිණුම හර කර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | පාරවල්,පාලම් හා බෝක්කු ගිණුමේ පාරවල් 17 කට අදාළ රු.36,129,902 ක වටිනාකම, දෙවරක් ගිණුම්ගත වී තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී සූර්ය බල පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් වැය කළ රු.7,104,000 ක මුදල ප්‍රාග්ධනීත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.268,355 කින් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.11,653 ක අවිනිශ්චිත ගිණුම නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී හඳුනා ගැනීමට කටයුතු කරන අතර මෙම ශේෂය අවිනිශ්චිත ගිණුමකට දැමීම සිදු කරන ලද්දේ හඳුනා ගන්නා තෙක් බව. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය පියවීමට කටයුතු කළ යුතුය. |
| (එ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දේපළ පිරියත මිලදී ගැනීම් රු.135,190,650 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරිමට කටයුතු කරන බව. | මුදල් ප්‍රවාහය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත්වල ආයෝජන කිරීම රු.2,650,273 ක් වූ අතර මෙම මුදල ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය තුළ දක්වා නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයක ශේෂය අදාළ උපයෝගී ලේඛන/ වාර්තා වල දැක්වෙන ශේෂය සමග සැසඳීමේදී රු.8,258,367 ක වෙනසක් විය. | නිවැරදි කිරිමට කටයුතු කරන බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේ නාගරික සංවර්ධන අරමුදල් ආයෝජන ගිණුමේ ශේෂය රු.42,617,405 ක් වූ අතර එම අරමුදල් තැන්පත් ගිණුමේ ශේෂ රු.49,478,513 ක් වුයෙන් රු.6,861,108 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඇ) | සභාවේ ගිණුම් අනුව දේශිය ණය සහ සංවර්ධන අරමුදල් ගිණුමේ වසර අවසාන ශේෂය රු.7,595,186ක් වුවද දේශිය ණය සංවර්ධන අරමුදලේ ශේෂ සනාථ කිරීම් අනුව රු.7,519,316 ක් වූයෙන් ඒ අතර රු.75,870 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවශ්‍ය උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.8,921,623 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2020,2021 හා 2022 වර්ෂවල ප්‍රාග්ධන ප්‍රදානවලින් හඳුනාගත් ප්‍රාග්ධන වත්කම් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කර නොතිබුණු බැවින් පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් හා ඒ සඳහා වූ ක්ෂය වීම් පිළිබඳ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.81,910,172 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.101,372,545 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 ------- | | | | 2021 ------- | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම (රු) 000' | බිල්කළ ආදායම (රු) 000' | රැස්කළ ආදායම (රු 000' | දෙසැම්බර් 31දිනට මුළු හිඟය (රු )000- ' | ඇස්තමේන්තුගත ආදායම (රු) 000' | බිල්කළ ආදායම් (රු) 000' | රැස්කළ ආදායම (රු) 000' | දෙසැම්බර් 31දිනට මුළු හිඟය (රු) 000' |
| i | වරිපනම් හා බදු | 244,688 | 250,620 | 238,377 | 222,220 | 250,215 | 244,429 | 188,873 | 288,063 |
| ii | කුලී | 24,545 | 24,879 | 25,168 | 11,928 | 24,082 | 23,305 | 16,799 | 12,243 |
| iii | බලපත්‍ර ගාස්තු | 600 | 473 | 473 | - | 1,500 | 1,718 | 1,718 | - |
| iv | වෙනත් ආදායම් | 9,200 | 8,735 | 8,755 | - | 9,770 | 7,592 | 7,565 | 1,593 |
| | එකතුව | 279,033 | 284,707 | 272,773 | 234,148 | 285,567 | 277,044 | 214,955 | 301,899 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වරිපනම් හා බදු ආදායම රු.250,619,612 ක් වුවද ඉන් රු.141,292,445 ක් අයකර ගෙන තිබූ අතර රු.109,327,166 ක් හෙවත් සියයට හතලිස් හතර (44%) ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ වරිපනම් බදු අය කර ගැනීම සඳහා දේපළ තහනම් නිලධාරින් වෙත හිඟ වාර්තා නිකුත් කර ගැනීම සඳහා ක්ෂේත්‍රයේ යොදවා, රතු නිවේදන නිකුත් කර, ජංගම සේවා පවත්වා ඇති බව. | පනතේ විධිවිධාන අනුව හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2022 ජනවාරි 01 දින වන විට වරිපනම් හා බදු ණයගැති ශේෂය රු.201,659,506 ක් වූ අතර ඉන් සමාලෝචිත වර්ෂය තුළ රු.75,276,385 ක් හෙවත් සියයට තිස්හතක් (37%) අයකරගෙන තිබුණද රු.126,383,121 ක් හෙවත් සියයට හැටතුන (63%) ක ප්‍රමාණයක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | -එම- | -එම- |
| (iii) | සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට හිඟව පවතින වරිපනම් බදු මුදලින් රු.50,000 ත්100,000 ත් අතර දේපළ 123 කින් රු.8,365,740 ක්ද රු.100,000 ට වැඩි දේපළ 73 කින් රු.25,097,966 ක් ද හිඟ හිටිව පැවතුණි. | රු.50,000 ට වැඩි හිඟ ශේෂ අය කර ගැනීමට හිඟ ලැයිස්තු ආදායම් පරීක්ෂක මහතුන් වෙත ලබා දී දේපළවලට වෙන වෙනම හිඟ බදු ගෙවන ලෙස දන්වා ලිපි යවා ඇති අතර රතු නිවේදන නිකුත් කළ බව. | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුළී | | |
| (ii) | සභාව සතු ටෙන්ඩර් මත බදු දිය හැකි දේපළ සංඛ්‍යාව 406 ක් වන අතර 2022 වර්ෂයේදී බිල් කළ වටිනාකම රු.21,188,230 ක් වුවද ඉන් රු.17,501,434 ක් පමණක් අය කරගෙන තිබුණි. | අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ඉටු කිරීම | | |
| | 2022 වර්ෂයේ පොදු අරමුදලින් ව්‍යාපෘති 174 ක් රු.375,140,879 ක මුදලින් ඉටු කිරීමට අනුමත වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කර තිබුනේ ව්‍යාපෘති 101 ක් පමණි. නොනිමි ව්‍යාපෘති 72 ක් පැවති අතර එහි වටිනාකම රු.162,212,215 ක් විය. එමෙන්ම 2021 වර්ෂයේ ගිවිසුම් අත්සන් කර තිබුණු රු.7,126,845 ක් වූ ව්‍යාපෘති 03 ක් 2023 පෙබරවාරි 23 දින දක්වා වැඩ ආරම්භ කර නොතිබුණි. | අවලංගු ව්‍යාපෘති 01 ක් පැවති අතර 72 ක් නොනිමි ව්‍යාපෘති ලෙස පැවති අතර මේ වන විට ව්‍යාපෘති 21 ක වැඩ අවසන් කර ගෙවීම්ද කර ඇති බව සහ තව දුරටත් නොනිමි ව්‍යාපෘති 51 ක් ක්‍රියාත්මක කිරිමට ඉතිරිව ඇති බව. | ව්‍යාපෘති නියමිත කාලය තුළ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මාර්ග පවරා ගැනීම හා නම් කිරීම | | |
| (i) | 2022 වර්ෂය තුළ මාර්ග 21 ක් සඳහා මහජනයා සිදු කරන ලද ඉල්ලීම් මත සභාව වෙත පවරා ගෙන සංවර්ධනය කිරීමට සභා තීරණගෙන තිබුණද ඒවා පවරාගෙන සංවර්ධන කටයුතු සිදු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | මාර්ග පවරා ගෙන සංවර්ධන කටයුතු කළ යුතුය. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 අගෝස්තු මාසයේදී වසා තිබුණ ජංගම ගිණුමක මුදල් යටතේ රු.2,052,258 ක නාමික වටිනාකමක් දක්වා තිබුණු අතර එය සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කර නොතිබුණි. | සිදු කරන ලද විමර්ශන පදනම් කර ගනිමින් මෙම ශේෂය කපා හැරිමට පළාත් පාලන කොමසාරිස්ට ලිපියක් යැවූ බව සහ ඒ සඳහා නැවතත් විමර්ෂනයක් කිරිමට කමිටුවක් පත් කර ඇති බව. | නිරවුල් කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති අංක 4/2018 දරන වත්කම් කළමනාකරණය චක්‍රලේඛ | මේ වන විට ප්‍රත්‍යාගණනය කිරිම සඳහා කටයුතු කරමින් පවතින බව. | ප්‍රත්‍යාගණනය කළ යුතුය. |

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද නගර සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ද වත්කම් ප්‍රත්‍යාගණන කර නොතිබුණි. | | |

**3.3 ශුද්ධ ගිණුම්කරණ ක්‍රමවේදය යටතේ සූර්ය බල පද්ධතියක් ස්ථාපිත කිරිම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රුපියල් මිලියන 11ක් වැයකර ස්ථාපනය කළ සූර්ය පැනල විදුලි පද්ධතිය මගින් උත්පාදනය වන විදුලිය ජාතික පද්ධතියට එකතු කිරීමේ ක්‍රමවේද 03 ක් පැවතියද සභාව විසින් වඩාත් වාසිදායක ක්‍රමවේදය හඳුනා ගැනීම සඳහා එම ක්‍රමවේදයන්හි පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් කිරීමකින් තොරව ශුද්ධ ගිණුම්කරණ ක්‍රමවේදය (Net Accounting System) හඳුනා ගෙන තිබුණි. | මෙය සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධීක්ෂණය යටතේ සිදු කළ බව. | පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

ගොඩනැගිලි පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් 73 ක් සම්බන්ධයෙන් තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර ඉන් ඉඩම් 38 ක පමණක් වටිනාකම් හඳුනාගෙන 2022 දී ගිණුම්ගත කර තිබුණි. | වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති බව. | වටිනාකම හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | විගණනයට ලද තොරතුරු අනුව සභාව සතු බවට හඳුනාගෙන තිබුණු ඉඩම් කොටස් 08 ක නීත්‍යානුකූලභාවය තහවුරු කිරීම සඳහා ඔප්පු ලබා ගෙන නොතිබුණි. | ප්‍රකාශන ඔප්පු සකස් කිරීමේ ක්‍රියාවලිය සඳහා යොමු කර ඇති බව. | ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි පළමු දින අත්සන් කරන ලද බදු ගිවිසුම මගින් මෙම බහු මහල් රථගාල බදු දී තිබුණි. එම බදු ගිවිසුමෙහි කොන්දේසි අංක 13 අනුව රථගාලෙහි ජල බිල්පත් හා විදුලි බිල්පත් බදු ගැනුම්කරු විසින් ගෙවිය යුතු වුවද 2022 | සභාව විසින් ගෙවා තිබූ විදුලි බිල් වලින් රු.103,000 ක් අය කර ගෙන ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව විදුලි බිල අය කර ගත යුතුය. |

වර්ෂයට අදාළව රු.172,079 ක් වටිනා විදුලි බිල්පත් සභාව විසින් ගෙවා තිබුණි.

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරින් 32 දෙනෙකුගෙන් රු.1,629,348 ක් ද මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 14 දෙනෙකුගෙන් රු.1,340,742 ක් ද සේවය හැර ගිය නිලධාරින් 23 දෙනෙකුගෙන් රු.1,140,446 ක් ද වශයෙන් එකතුව රු.4,110,536 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ණය ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.7 කොන්ත්‍රාත් පාලනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මාකුඹුර ආදාහනාගාරය ඉදිකිරීම | | |
| (අ) | 2020 ජුලි 17 දිනැති අංක 03/2020 දරන පළාත් පාලන පරිසර අමාත්‍යාංශය (බස්නාහිර පළාත්) චක්‍රලේඛයේ 02 වගන්තිය ප්‍රකාරව අදියර ගතව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක වුවද එක් එක් අදියරයට අදාළ විෂය පථය සහ මුළු පිරිවැය ඇස්තමේන්තුව සකසා අනුමැතිය ලබා ගත යුතු අතර එක් එක් අදියරයකට අදාළ ටෙන්ඩර් කැඳවීමට එම අදියරට අදාළ ඇස්තමේන්තුව භාවිතයට ගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී මාකුඹුර ආදාහනාගාරය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.31,700,000 ක් වූ අතර එය කාර්යයන් 08 ක් ලෙස ඇස්තමේන්තු සකසා ප්‍රජා පාදක සමිති 02 ක් වෙත පිරිනමා තිබුණි. | එක් එක් අදියරයට අදාළ විෂය පථය සකසා නොමැති බව පිළිගන්නා බව. නමුත් මුළු පිරිවැය ඇස්තමේන්තුවේ (1වන අදියර හැර) ඉදිරි අදියරයන් සඳහා අදාළ අනුමැතිය ලබා ගෙන ඇති බව සහ 1/2021 චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන සඳහා කර්මාන්ත පිරිනැමීම සඳහා ඒ ඒ අදියරයට අදාළව ඇස්තමේන්තුව භාවිතයට ගෙන ඇති බව. මෙම කර්මාන්තය පිරිනමා ඇති සමිති දෙකම ආදාහනාගාරයට අයත් කොට්ඨාශයේම ලියාපදිංචි ක්‍රියාකාරි සංවිධාන දෙකක් බව. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | එසේම යථෝක්ත චක්‍රලේඛයේ 03 වගන්තිය ප්‍රකාරව සාධාරණීකරන වාර්තා හා ශක්‍යතා වාර්තාවක්ද ඉදිරිපත් කර නොතිබුණු අතර 06 වන වගන්තිය ප්‍රකාරව රු.මිලියන 4 ට වඩා වැඩි මුළු පිරිවැය ඇස්තමේන්තුගත ව්‍යාපෘති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා ඉදිකිරීම් සංග්‍රහයට කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (CIDA) කොන්ත්‍රාත් කොන්දේසි හා පිරිවිතර අනුව ගිවිසුම්ගත විය යුතු වුවත් මෙම කාර්යයේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා බව. ඒ අනුව ශක්‍යතා වාර්තා හා සාධාරණීයකරණ වාර්තා සකස් කර නොතිබුණද ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඇති බව සහ මහා සභාවේ අනුමැතිය පරිදි අදියර වශයෙන් සකස් කරන ලද අනුමත ඇස්තමේන්තුව පාදක කර ගනිමින් 1/2021 චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන මගින් කර්මාන්තය ඉටු කර ගෙන ඇති බව. | සාධාරණීය කරණ වාර්තා හා ශක්‍යතා වාර්තා ඉදිරිපත් කළ යුතුය. |